**තේ ශක්ති අරමුදල - 2020**

--------------------------------

තේ ශක්ති අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමණාකරනයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016, 2017, 2018, 2019 හා 2020 යන වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

--------------------

**2.1 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

--------------------------------------------------

අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ලෙජර ගිණුම්, ස්ථාවර වත්කම් ලේඛනයක් හා ස්ථාවර තැන්පතු ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

**---------------------------------**

අරමුදල විසින් අවසන්වරට විගණනයට ඉදිරිපත් කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් සහ වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| ---------- | ---------- |
| **වත්කම්** | |
| **--------** | |
| ජංගම නොවන වත්කම් | 350,332,493 |
| ජංගම වත්කම් | 346,460,128 |
| **මුළු වත්කම්** | **696,792,621** |
| **වගකීම්** | |
| **-------** | |
| ස්කන්ධ ප්‍රාග්ධන | (111,648,540) |
| ජංගම නොවන වගකීම් | 481,088,651 |
| ජංගම වගකීම් | 327,352,510 |
| **මුළු වගකීම්** | **696,792,621** |

**2.3 හිඟ ආදායම්**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)තේ ශක්ති අරමුදල අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර අරමුදලේ ස්කන්ධ ප්‍රාග්ධනය ක්‍රමයෙන් අඩු වෙමින් පැවැතුණි. ඒ අනුව 2012 වර්ෂයේ දී රු.මිලියන 124 ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ දී රු.මිලියන 112 ක සෘණ ස්කන්ධ ප්‍රාග්ධන තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. මෙම තත්ත්වයන් මත 2016 ජුලි 13 දිනැති අංක අමප/ 16/1224/726/015-I දරන අමාත්‍ය | එකඟ වෙමි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මණ්ඩල තීරණය මඟින් තේ ශක්ති අරමුදලේ කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව විගණිත දිනය වන විට අරමුදලට ලැබිය යුතු හිඟ වාරික හා ප්‍රමාද ගාස්තු වටිනාකම වන රු.517,625,223 ක් වුවද, 2020 වර්ෂය දක්වා ලැබී තිබූ බදු ආදායම රු.130,867,813 ක් වීමෙන් එය ලැබිය යුතු ආදායමෙන් සියයට 25 ක් පමණක් විය. | | |
| (ආ)කර්මාන්තශාලා බදු දීම සම්බන්ධයෙන් බදුකරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව හොරණ පොහොර ගබඩාව, මාවරල තේ වත්ත හා කම්හල් 09 කින් 2020 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බදු මුදල් ප්‍රමාණය වූ රු.88,094,402 ක් අය කර ගෙන නොතිබුණි. | එකඟ වෙමි. මෙම කම්හල් අතරින් වලහන්දුව,මහවැලි හා රයිගම්කෝරලේ කම්හල් මේ වනවිට තේ ශක්ති අරමුදල වෙත නැවත පවරා ගෙන නව ගැණුම්කරුවකු වෙත කළමණාකරණය පවරා ඇත. | හිඟ වාරික අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ)බදු ගිවිසුම් අනුව අයවිය යුතු මාසික බදු කුලිය ඊළඟ මස පළමු වන දින හෝ ඊට පෙර නොලැබීම මත ගතවන සෑම දිනකටම බදු මුදලින් සියයට එකක ප්‍රමාද ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කළ යුතු බැවින් 2020 දෙසැම්බර් 31 දිනට බදුකරුවන් 16 දෙනෙකුගෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් රු.429,530,881 ක් අයකර ගැනීමට පවතින බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු උපරිම කාර්යක්ෂමතාවකින් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා කළමණාකරණ ගැණුම්කරු අපොහසත් වී ඇති අතර, ප්‍රදේශයේ දළු නිෂ්පාදනය අනුව කම්හල සඳහා ප්‍රමාණවත් දළු සපයා ගැනීම ගැටළුවක් වී ඇති අතර, කම්හලේ කළමණාකරණ ගාස්තු මුදල කම්හලේ ධාරිතාව මත තීරණය වීම නිසා ඉහළ අගයක් ගෙන ඇත. මේ තත්ත්වය යටතේ කම්හල පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳව කළමණාකරණය ගැණුම්කරුවන්ගෙන් යෝජනා ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. |
| (ඇ)රයිගම් කෝරලේ තේ ශක්ති කම්හල 2016 ජූනි 10 දින සිට 2021 ජූනි 10 දින දක්වා දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත බදු පදනම මත ලබාදී තිබුණද කම්හල දිගින් දිගටම වසා දැමීම හේතුවෙන් 2020 ඔක්තෝබර් මස නැවත | බදු මුදල් ගෙවීම පැහැර හැරීම හා කම්හල තුළ නිෂ්පාදන කටයුතු සිදු නොකිරීම මත ගිවිසුම අවසන් වීමට ප්‍රථම කම්හල නැවත පවරා ගෙන අදාළ මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදයක් සමග නව බදුකරුවකු වෙත මේ වන විට පවරා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| කම්හල අරමුදල වෙත පවරාගෙන තිබුණි. එම අවස්ථාව වන විට එකී සමිතියෙන් රු.7,960,310 ක් තේ ශක්ති අරමුදල වෙත අයවිය යුතුව පැවතුණි. | | |
| (ඉ)(i)වලහන්දූව තේ ශක්ති කම්හල 2017 ජූලි 23 දින සිට වසර 10 ක් තේ නිෂ්පාදනය සඳහා කර්ක් මෙල්මැන් ජොබ්ස් පුද්ගලික සමාගම වෙත අවබෝධතා ගිවිසුමක් මඟින් පවරාදී තිබුණි. බදු වාරික නොගෙවීමේ හේතුවෙන් 2018 ජුනි 01 දින නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගෙන තිබුණද අයවිය යුතු හිඟ වාරික වටිනාකම හා ප්‍රමාද ගාස්තු පිළිවෙලින් රු.2,115,000 ක් හා රු.7,642,200 ක් වී තිබුණි. | එකඟ වෙමි.<br>වලහන්දූව කම්හලේ නිත්‍යානුකූල අයිතිය රාජ්‍ය වැවිලි සංස්ථාව සතු අතර කැබිනට් තීරණයක් පරිදි කම්හල සහ වතු බංගලා 02ක් තේ ශක්ති අරමුදල වෙත පවරා දී ඇත. ඒ අනුව කළමණාකරණය ය කර්ක් මෙල්මැන් ආයතනයට පැවරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් වතු බංගලාව නැවත පවරා ගැනීම හේතුවෙන් අදාළ ආයතනය විසින් කම්හලේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු නොකල අතර කම්හල නැවත පවරා දෙන ලදී. ඒ අනුව අදාළ ආයතනය විසින් තබා තිබූ මාස 06 ආරක්ෂිත තැන්පත් මුදල හිග වාරික සඳහා හිලව් කිරීමෙන් අනතුරුව ගෙවිය යුතු ඉතිරි මුදල ඒ සඳහා වන ප්‍රමාද ගාස්තු දක්වා ඇත. | බදු කුලී අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii)එම කම්හල නැවත පවරා ගැනීමෙන් පසුව 2019 සැප්තැම්බර් 09 දින සිට වසර 10 ක කාලයකට තේ නිෂ්පාදනය සඳහා බ්‍රොම්බිල් ඕර්තඩොක්ස් සමාගම වෙත අවබෝධතා ගිවිසුමකින් පවරාදී තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට හිඟ කළමණාකරණ ගාස්තු රු.1,240,000 ක් හා ප්‍රමාද ගාස්තු රු.82,533 ක් තවදුරටත් අරමුදලට අයවිය යුතුව පැවතුණි. | එකඟ වෙමි.කම්හල තුළ විශාල කාලයක් නිෂ්පාදන කටයුතු නවතා දමා තිබූ බැවින් නැවත නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට හා 2020 මාර්තු මස ආරම්භ වූ කොරෝනා වසංගතය හේතුවෙන් විශාල කාලයක් වීම මත නියමිත දිනට නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ බැවින් මුල් බදු වාරික 03ක් ගෙවීම පැහැර හැර ඇතත් ඉන්පසු මේ දක්වා අඛණ්ඩව නිසි පරිදි මෙම වාරික ගෙවනු ලබයි. | -එම- |
| (iii)බ්‍රොම්බිල් සමාගමේ අධ්‍යක්ෂකගේ 2019 ඔක්තෝබර් 16 දිනැති ලිපිය ප්‍රකාරව රු.1,500,000 ක් වටිනා උපකරණ කර්මාන්තශාලාව භාරගන්නා විට තේ ශක්ති අරමුදල විසින් නව කළමණාකාරීත්වයට භාරදී නොතිබුණි. | එකඟ වෙමි. | කර්මාන්තශාලාව ඇතුළු සියලුම වත්කම් ලිඛිතව බදුකරු වෙත භාර දීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණය තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | තේ ශක්ති අරමුදල සතු නිශ්චල හා චංචල දේපළ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම හා යාවත්කාලීන කොට පවත්වාගෙන යාම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | තේ ශක්ති අරමුදල සතු ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් ඇති අතර එය යාවත්කාලීන කොට නොමැත. කෙසේ වෙතත් තේ ශක්ති අරමුදල සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වන විට ලිඛිතව දන්වා ඇති අතර අදාළ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව, නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් ලේඛනයක් සකස් කර යාවත්කාලීන කොට පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කර්මාන්තශාලා බදු දීමෙන් ලැබෙන ආදායමෙන් කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුභසාධන රක්ෂණ අරමුදලෙන් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු.මිලියන 135 ක මුදල් නැවත එම අරමුදල වෙත ලබා දීමට කටයුතු කිරීම සහ ඉන් අනතුරුව ඉතිරිවන බදු ආදායම මුදල් අමාත්‍යාංශය වෙත බැර කිරීම තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂාව විය. එසේ වුවද අපේක්ෂිත අයුරින් කර්මාන්තශාලා බදු ආදායම් ලබාගැනීමට අපොහොසත් වීම නිසා අරමුදල ප්‍රතිව්‍යුහගත කළ 2016 වර්ෂයේ සිට වර්ෂ 04 ක් පමණ ගත වුවද උක්ත අරමුණු කරා ලඟාවීමට අරමුදලට නොහැකි වී තිබුණි. | බදු හා කළමණාකරණය ආදායම් අපේක්ෂිත ආකාරයට නොලැබීම හේතුවෙන් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු අපේක්ෂිත කාල වකවානුකුල ඉටු කර ගැනීමට නොහැකි වී ඇත.කෙසේ වෙතත් මේ වනවිට රු මිලියන 135 වන සුභ සාධන රක්‍ෂණ අරමුදල ගොඩනැගීම සඳහා බදු හා කළමණාකරණය ආදායම මගින් රු මිලියන 115 පමණ මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර අදාළ අරමුදල ගොඩනගමින් පවතින අතර, ඉදිරියේදී අපේක්‍ෂිත අරමුණු කරා ලඟාවීමට අපේක්‍ෂා කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණ ඉටු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)තේ ශක්ති අරමුදලේ පූර්ණ සාමාජිකත්වය ලබා ඇති හා සුදුසුකම් සපුරාලන සාමාජිකයන් හට එකී නීති රීති වලට යටත්ව රක්ෂණාවරණය සැලසීම සිදු කරන අතර 2017 වර්ෂයේ සිට රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණද වාර්ෂිකව රක්ෂණ වාරික මුදල දැනට තේ ශක්ති අරමුදලින් ගෙවනු ලබයි. ඒ අනුව 2020 මාර්තු 01 දින සිට වසරක කාලයක් වෙනුවෙන් ශ්‍රී ලංකා මර්චන්ට් බැංකු රක්ෂණ සමාගම වෙත රු.12,169,673 කට රක්ෂණය පිරිනමා තිබුණි. කෙසේ වුවද 2017 සිට 2020 පෙබරවාරි මාසය දක්වා අලියන්ස් රක්ෂණ සමාගම වෙත රක්ෂණාවරණය පවරා තිබුණද එම සමාගමෙන් ලැබිය යුතු නමුත් මේ දක්වා ලැබී නොමැති ප්‍රතිලාභ මුදල රු.9,571,877 ක් හා ප්‍රමාද වී අයදුම්කිරීම හේතුවෙන් රක්ෂණ හිමිකම හිමි නොමැති වුවත් රක්ෂණ සමාගම සමඟ එකඟතාවයට පැමිණ ලබා ගත යුතු රක්ෂණ ප්‍රතිලාභ වටිනාකම රු.1,900,000 ක් වී තිබුණි. එමෙන්ම රු.1,340,000 ක් මෙම රක්ෂණ සමාගමෙන් ප්‍රතිලාභ ලෙස ලැබී තිබුණද සුබසාධන රක්ෂණ අංශය විසින් අදාළ මුදල් ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කර නොතිබුණු බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණක විසින් හඳුනාගෙන තිබුණි. | තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධව 2016.06.21 දින වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍යමණ්ඩල සංදේශය සඳහා ලද අමප 16/1224/726/015-1 හා 2016 ජූලි 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තේ ශක්ති අරමුදල මගින් ක්‍රියාත්මක කළ සුභසාධන රක්ෂණ ව්‍යාපෘතිය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එම ව්‍යාපෘතිය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අවධියේ අදාළ තත්ත්වය ඇතිවී ඇති අතර තේ ශක්ති අරමුදල සම්බන්ධව ගැටළු හා ඉදිරියේදි ආයතනය පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් යෝජනා ලබා ගැනීමට මේ වන විට පත්කොට ඇති කමිටුව මගින් ඒ සම්බන්ධව ලබා දෙන යෝජනා අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | හිඟ රක්ෂණ ප්‍රතිලාභ වටිනාකම ලබා නොගෙන තිබීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව පත්කොට ඇති කමිටුව මගින් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ඇ)අරමුදලට අයත් කර්මාන්ත ශාලා බදු දීම සඳහා ඇති කර ගනු ලැබූ බදු ගිවිසුමේ (07) වන වගන්තිය ප්‍රකාරව නිෂ්පාදන කටයුතු ආරම්භ කරන අවස්ථාවේදී කර්මාන්තශාලාවලට අදාළ මාසික අමු දළු ධාරිතාවයට සරිලන වටිනාකම මත රක්ෂණාවරණයක් තේ ශක්ති අරමුදල නමින් ලබාගැනීමට බදු ගැණුම්කාර පක්ෂය කටයුතු කළ යුතු වුවත්, කර්මාන්තශාලා 09 කින් අදාළ රක්ෂණාවරණය ඉදිරිපත් කොට නොතිබුණි. | බදු/කළමණාකරණය ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තශාලාවල මාසික අමුදළු ධාරිතාවය මත බැංකු ඇපකරයන් තේ ශක්ති අරමුදල නමින් ලබා ගත යුතු වන අතර හා කම්හලේ ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර විදුලිජනක පද්ධතිය ඇතුළු උපාංග සහිත කම්හල් පරිශ්‍රයද ඇතුළත්ව පළමු පක්ෂය වන තේ ශක්ති අරමුදල නමින් දෙවන පක්ෂය වන බදු/කළමණාකරණය ගැණුම් පාර්ශවය විසින් ලබා ගත යුතුව ඇත. ඒ අනුව, අදාළ රක්ෂණාවරණය ඇතැම් බදු/කළමණාකරණය ගැණුම්කරුවන් විසින් ලබා ගෙන ආයතනය වෙත ඉදිරිපත් කොට ඇති අතර, බැංකු ඇපකරය ඉදිරිපත් කොට නොමැත. | බදු/කළමණාකරණය ගිවිසුම් ප්‍රකාරව තේ ශක්ති අරමුදල නමින් රක්ෂණාවරණයක් ලබාගැනීමට බදු ගැණුම්කාර පක්ෂයන්ව උනන්දු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)මාවරල තේ කර්මාන්තශාලාවේ තේ නිෂ්පාදන කටයුතු වසර 3 ක සිට එනම් බදු ගත් දින සිට 2021 ජනවාරි දක්වා ආරම්භකර නොතිබුණු අතර ගොඩනැගිල්ල හා යන්ත්‍ර සූත්‍ර අබලන්වීම නිසා කම්හල තේ නිෂ්පාදනයට සුදුසු නොවීම, කර්මාන්තශාලාවේ පවතින දැඩි මූල්‍ය අර්බුදය වැනි හේතු දක්වමින් හිඟ බදු ගෙවීම්ද පැහැර හැර තිබුණි. | එකඟ වෙමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු අයකර ගත යුතුය. |
| (ඉ)2020 මැයි 15 දින හොරණ පොහොර ගබඩා පරිශ්‍රයේ නේවාසිකාගාරයක් තුළ සිදු වූ ගැටුමකින් පුද්ගලයින් දෙදෙනෙකු මියයාමත් එක් අයෙකු බරපතල තුවාල ලැබීමත් හා මත්ද්‍රව්‍ය භාවිතා කිරීමත් සිදු වී තිබුණි. මෙම කරුණු හේතුවෙන් දේපළවල සුරක්ෂිතභාවය හා අවභාවිතාවීම වැලැක්වීම පිළිබඳ අවධානය යොමු විය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වෙමි.<br>ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ සේවකයන් සම්බන්ධ සියළු වගකීම් කළමණාකරණය ගැණුම්කරු වෙත පැවරෙන බවට ගිවිසුම් ප්‍රකාරව දෙපාර්ශවයම එකඟ වී ඇති නමුත් මෙවැනි තත්ත්වයක් ඉදිරියේ ඇති නොවීමට කටයුතු කරන ලෙස කළමණාකරණය ගැණුම්කරු වෙත ලිඛිතව දැනුම් දී ඇත. | මෙවැනි ක්‍රියාවන් නැවත ඇති වීමට ඇති ඉඩ ප්‍රස්ථා වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ)ගිලීමලේ තේ ශක්ති කම්හල 2016 නොවැම්බර් 24 දින සිට වසර 10 ක කාලයක් සඳහා පෞද්ගලික බදුකරුවකු වෙත ලබා දී තිබුණද මාස 21 ක කාලයක් තුළ කිසිදු නිෂ්පාදන කටයුත්තක් මෙම කම්හල තුළ සිදු කර නොතිබුණු බවත්, තේ නිෂ්පාදනය සිදු කර තිබෙන මාස වලද කම්හලේ ධාරිතාවයෙන් සියයට 50 කට වඩා අඩුවෙන් සිදු කර තිබුණු බවත් ගොනුගත කරුණු අනුව නිරීක්ෂණය විය. එමෙන්ම අරමුදල වෙත ලබාදී තිබෙන තොරතුරු අනුව නිෂ්පාදිත තේ සඳහා තේ වෙන්දේසියේ පහළ මිලක් ලැබීම, දළු සැපයුම්කරුවන්ට දළු සඳහා අඩු මිලක් ගෙවීම හේතුවෙන් අඛණ්ඩව දළු සපයාගැනීමේ අපහසුතාවය,හා කම්හලේ මෙහෙයුම් ආදායමින් වියදම් පියවාගැනීමට නොහැකිවීමත් යන හේතුන් නිසා තව වසර 6 ක් බදු ගිවිසුම පවත්වාගැනීමේ අපහසුතාවයක් පවතින බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි.<br>අරමුදලේ ඇති වී ඇති ගැටළු සම්බන්ධව කමිටුව මගින් ලබා දෙන නිර්දේශ මත ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව ඇත. | ගිවිසුම් ප්‍රකාරව බදු ගිවිසුම අවලංගුකර නව ගැණුම්කරුවෙකු වෙත බදු දීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (උ)2016 දෙසැම්බර් 28 දින සිට 2026 දෙසැම්බර් 27 දින දක්වා වසර 10 ක කාලසීමාවක් සඳහා දැරණියගල තේ ශක්ති කම්හලේ කළමණාකාරිත්වය රත්නපුර ප්ලාන්ටේෂන් (පුද්ගලික) ලිමිටඩ් වෙත බදු පදනම මත ලබාදී තිබුණද 2020 සැප්තැම්බර් 14 දිනැති සහකාර කම්හල් නිලධාරිගේ ලිපිය ප්‍රකාරව තේ ශක්ති අරමුදලට අයත් වර්ණ විභේදන යන්ත්‍රය භාවිතා කිරීමෙන් තොරව කම්හල තුළ රඳවා තිබෙන බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. කම්හල් භාර දෙන අවස්ථාවේදී එම කම්හලේ පැවති ගොඩනැගිලි යන්ත්‍රසූත්‍රවල වටිනාකම් මත කම්හල් ගැණුම්කරුවන් විසින් ඉදිරිපත් කළ මිල ගණන් අනුව කම්හල් ගැණුම්කරුවන් තෝරා ගෙන ඇති බැවින් ගැණුම්කරුගේ එකඟතාවයකින් තොරව ගිවිසුම් කාලය අවසන් වීමට ප්‍රථම භාවිතා නොකිරීම යන කරුණු පදනම් කොට ගෙන භවිතයට නොගන්නා යන්ත්‍රසූත්‍ර සම්බන්ධව ගිවිසුම අනුව අරමුදලට ක්‍රියා කිරීමේ හැකියාවක් නොමැත. | වත්කම් ආරකෂා කර ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතු අතර භාවිතා නොකරන වත්කම් ඵලදායී ලෙස වෙනත් කම්හලකට ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඌ)අරමුදලට අයත් මහවැලි තේ ශක්ති තේ කම්හල් ඉඩමේ කොටසක් සම්බන්ධයෙන් හා බලංගොඩ තේ ශක්ති තේ කම්හල් ඉඩමේ පර්චස් 5.41 ක ඉඩම් ප්‍රමාණයක ගරාජයක් ඉදිකිරීමට එරෙහිව බාහිර පාර්ශවයකට අරමුදල විසින් නඩු දෙකක් පවරා තිබුණි. | එකඟ වෙමි. | කම්හල පිහිටි භූමියට බාහිර පාර්ශවයන්ට ප්‍රවේශ වීමට ඉඩ නොතැබීමට කටයුතු කළ යුතුය. |
| (එ)තේ ශක්ති අරමුදල වෙතින් කළමනාකරණය භාරගත් පෞද්ගලික කම්හල් වෙත අක්‍රීය කම්හල් සක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපරිම සීමාව රු. ලක්ෂ 07 කට යටත්ව ණය මුදලක් සපයා තිබුණු අතර අදාළ ගිවිසුම් කාලය අවසන් වූ පසුව තේ ශක්ති අරමුදලට අයවීමට තිබුණු මුදල් අයකර ගැනීමට තේ කම්හල් 05 ක ට එරෙහිව නඩු පවරා තිබුණි. | අදාළ ව්‍යාපෘතිය යටතේ හිඟ ණය මුදල් පැවති සියළු කම්හල් වෙත නඩු පවරා ඇති අතර ඇතැම් කර්මාන්තශාලා වෙනුවෙන් ලබා දී ඇති ණය මුදල් නඩු තීන්දු මගින් මේ වන විට අයකර ගැනීමටද කටයුතු කොට ඇත. | නඩු කටයුතුවලට සාර්ථකව යොමුවී සියලු ණය මුදල් අරමුදලට අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ)සමාලෝචිත වර්ෂයේ කම්කරු උසාවි නඩු නියෝග අනුව රු.1,565,370 ක වන්දි මුදලක්ද, නඩු සමතයන් අනුව රු.2,597,675 ක වන්දි මුදලක්ද තේ ශක්ති අරමුදලින් සේවකයින් වෙත ගෙවීමට සිදු වී තිබුණි. | එකඟ වෙමි. | සේවය අවසන් කර වන්දි ගෙවීම් සිදුකිරීමේදී නීත්‍යානුකූලව කටයුතු කිරීමට කළමණාකරණය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඔ)රයිගම් කෝරලේ තේ ශක්ති කම්හලේ පළමු බදුගැණුම්කාර පාර්ශවය විසින් ලබාගෙන තිබුණු බදු කාලය තුළ නිරවුල් කළ යුතුව පැවති හිඟ විදුලි බිල්පත්, වෙළඳ හිමියන්, තැරැව්කාර සමාගම් ණය, ප්‍රාදේශීය සභා ගාස්තු, තේ ශක්ති අරමුදල වෙත ගෙවිය යුතුව ඇති බදු මුදල් ලෙස රු.49,417,999 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම බදු ගිවිසුමේ 9 (i) වගන්තිය ප්‍රකාරව විසන්ධි කර තිබුණු විදුලි සම්බන්ධතාවය ලබාගැනීම සඳහා හිඟ විදුලි බිල්පත සම්පූර්ණයෙන්ම ගිවිසුමෙහි පළමු වසර තුළ ගෙවා අවසන් කිරීමටත්, කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු රු.23,302,827 ක් වූ සම්පූර්ණ හිඟ ණය මුදල වසර 5 ක් තුළ ගෙවා අවසන් කිරීමටත්, නව බදු ගැණුම්කාර පාර්ශවය විසින් එකඟ වී තිබුණි.එසේ වුවද නව බදු ගැණුම්කාර පාර්ශවය විසින් පැරණි බදුකරුගේ විවිධ ගෙවීම් සඳහා එකඟ වී තිබුණද, මේ දක්වා නියමිත වූ තම හිඟ බදු කුලී හෝ ගෙවා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | ගිවිසුම් ප්‍රකාරව එකඟ වූ ගෙවීම් නිරවුල් කර ගැනීමට නොහැකි වූ හේතු අධ්‍යනය කර නිසි පියවර ගත යුතුය. |
| (ඕ)2017 ජනවාරි 30 දින සිට 2027 ජනවාරි 29 දක්වා අවුරුදු 10 ක කාලසීමාවක් සඳහා කොත්මලේ තේ ශක්ති කර්මාන්තශාලාවේ කළමණාකාරීත්වය රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම වෙත අවබෝධතා ගිවිසුමක් මඟින් භාරදී තිබුණි. එයට අදාළව පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | | |
| (I) 2020 සැප්තැම්බර් 09 දින තේ ශක්ති අරමුදලේ කළමණාකරණය සහකාර විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී කම්හල වසාදමා තිබුණු බවත්, 2021 ජනවාරි 25 දිනැති සහකාර තේ කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව තේ කර්මාන්තශාලා අධීක්ෂණයේදී මෙම කම්හල ක්‍රියාකාරීත්වයේ නොපවතින බවත් වාර්තා කර තිබුණි. | එකඟ වෙමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර මෙම කම්හල නැවත බදු දීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (II) ලංකා විදුලිබල මණ්ඩලයට 2021 ජනවාරි මාසයට ගෙවිය යුතු විදුලි බිල්පත් ගාස්තුව රු.699,363 ක් වී තිබුණු අතර එතෙක් බිල්පත් ගෙවීමද බදු ගැණුම්කරු විසින් පැහැර හැර තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | ගිවිසුම් ප්‍රකාරව එකඟ වූ ගෙවීම් නිරවුල් කර ගැනීමට නොහැකි වූ හේතු අධ්‍යනය කර අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (III) මෙම තේ ශක්ති කර්මාන්තශාලාව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන අනුව බදු පදනමට ලබාගත් ඉඩමක පිහිටුවා තිබෙන අතර, අරමුදල විසින් වාර්ෂිකව මහවැලි අධිකාරියට බදු මුදල් ගෙවීම සිදු කරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂයට අදාළව රු.1,204,335 ක් මහවැලි අධිකාරියට තේ ශක්ති අරමුදල විසින් බදු මුදල් ලෙස ගෙවා තිබුණු අතර 2020 වර්ෂයට මෙම මුදල නැවත සංශෝධනය කර ගෙවීමට සිදු වී ඇත. ඒ අනුව කම්හල බාහිර පාර්ශවයකට පැවරීමෙන් හිඟ හිටි විදුලි බිල්පත් ප්‍රමාණයත්, වසර 5 කට වරක් අළුත් කරන මහවැලි සංවර්ධන අධිකාරියට ගෙවීමට සිදු වන බදු මුදලත් මෙම අරමුදලට විශාල වැය බරක් වන බවත්, කම්හල ක්‍රියාකාරී නොවීමෙන් එහි තිබෙන වත්කම් විනාශවීමද සිදු වන බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වෙමි.<br>කම්හල සඳහා අවශ්‍ය නොවන වතු බංගලාව මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නැවත පවරා දී වාර්ෂිකව ගෙවිය යුතු බදු මුදල අඩුකර ගැනීමට කටයුතු කර ඇත. කම්හල් සම්බන්ධව මේ වන විට පත් කොට ඇති කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව ඇත. | ගිවිසුම් ප්‍රකාරව එකඟ වූ ගෙවීම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.2 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට අනුමැතිය ලබාදෙන ලද 2016 ජුලි 13 දිනැති අංක අමප/16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ස්ථිර කාර්යය මණ්ඩලය අමාත්‍යාංශය යටතේ පවත්නා වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමේදී අදාළ ආයතනයේ | එකඟ වෙමි.<br>තේ ශක්ති අරමුදල සතුව තිබූ GG-6407 අංක දරණ වාහනය වෙනුවෙන් රියදුරු රඳවා ගෙන ඇති අතර, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති තේ ශක්ති සුහසාධන අංශයේ අවශ්‍යතාව මත එම වාහනය සමග | බාහිර ආයතනයකට මුදාහළ නිලධාරීන්ට ගෙවන ලද වැටුප් ප්‍රතිපූරණය කරගත යුතුය. |

කැමැත්ත මත සහ කාර්ය මණ්ඩල වැටුප් හා වේතන එකී ආයතනවල පවත්නා අයවැය ප්‍රතිපාදන මත ගෙවීමට කටයුතු කළ යුතු වුවද එයට පටහැනිව කළමණාකරණය සහකාර නිලධාරින් තුන්දෙනෙක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවටද, රියදුරෙකු කුඩා තේ වතු සංවර්ධන අධිකාරියටද, මුදාහැර 2018 වර්ෂයේදී එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් ලෙස රු.1,459,614 ක් හා 2019 වර්ෂයේ රු.1,822,298 ක්ද මෙම අරමුදලෙන් ගෙවීම් කර තිබුණි. එමෙන්ම 2020 වර්ෂයේදී ද ඉහත කළමණාකාර සහකාර නිලධාරීන් දෙදෙනෙකු හා රියදුරෙකු වෙනුවෙන් රු.1,587,324 ක් ගෙවා තිබුණි.

රියදුරු එම ආයතනය වෙත අනුයුක්ත කර ඇත. අදාළ ආයතනවල එවකට පැවති සේවා අවශ්‍යතා මත අනෙකුත් සේවයකයන් අනුයුක්ත කර ඇති අතර, ඉදිරියේදී අදාළ ආයතන සමග සාකච්ඡා කර ඒ පිළිබඳ සමාලෝචනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී.